

පුවත්පත් නිවේදනය 1: දරිද්‍රතාව

# අලුතින් දුප්පතුන් වූ අය: පසුගිය වසර 4 තුළ ශ්‍රී ලාංකිකයන් මිලියන 4ක් දරිද්‍රතාවයට පත් විය.

(කොළඹ, 2023 ජූනි 7)

LIRNEasia නම් කලාපීය චින්තන පර්ෂදය විසින් මෑතකදී සිදු කරන ලද ජාතික නියෝජිත (ශ්‍රී ලංකාවම නියෝජනය වන පරිදි කරන ලද) සමීක්ෂණයකින් පෙන්නුම් කළේ දරිද්‍රතා රේඛාවට පහළින් ජීවත් වන ශ්‍රී ලාංකීය ජනගහනය මිලියන 4කින් වැඩි වී ඇති බවයි. 2019 දී ශ්‍රී ලාංකිකයින් මිලියන 3ක් දරිද්‍රතාවයෙන් පෙළුනු අතර, දැන් (2023) එය මිලියන 7ක් (ජනගහනයෙන් 31%) බවට පත් වී ඇත.








මූලාශ්‍රය: LIRNEasia (2023)

2023 සමීක්ෂණයට අනුව දරිද්‍රතා රේඛාවට පහළින් ජීවත් වන අයගෙන් 81% ක් ග්‍රාමීය ප්‍රදේශ වල ජීවත් වේ. 2019 සිට ග්‍රාමීය දරිද්‍රතාවය දෙගුණ (15% සිට 32% දක්වා) වී තිබෙන අතර, නාගරික දරිද්‍රතාවය තෙගුණ (6% සිට 18% දක්වා) වී ඇත. දිගින් දිගටම නරකම තත්ත්වයට දෙන්නේ වතු ප්‍රජාවයි - ඔවුන්ගෙන් අඩකට වඩා වැඩි ප්‍රතිශතයක් දරිද්‍රතාවයේ ජීවත් වෙති.

මේ අතර, පවතින සමාජ ආධාර වැඩසටහන් සමාජයේ දුප්පත්ම ජනතාව වෙත ළඟා වීමට අපොහොසත් වී ඇති බව ද සමීක්ෂණය මගින් හෙළිදරව් විය. දුප්පත් කමින් වැඩිම නිවාස දහයෙන් පංගුවෙන් 31%ක් පමණක් සමෘද්ධිය ලබන අතර ධනවත් කමින් වැඩිම නිවාස දහයෙන් පංගුවෙන් 4%ක් ද සමෘද්ධිය ලබති.

වියදම් වැඩිම/ අඩුම දහයෙන් පංගු (expenditure decile) අනුව, සමෘද්ධි ප්‍රතිලාභී පවුල්
(දහයෙන් පංගු අනුව පවුල් ප්‍රතිශතය)




2023 ජුනි මස 7 වැනි බදාදා දින LIRNEasia විසින් සංවිධානය කරන ලද වැඩසටහනකදී මෙම සොයාගැනීම් බෙදා ගන්නා ලදී. එහිදී මුදල් රාජ්‍ය අමාත්‍ය ගරු ෂෙහාන් සේමසිංහ මහතා විසින් ප්‍රධාන දේශනය පවත්වන ලදී. මෙහිදී පවත්වන ලද විද්වත් සාකච්ඡාවට බී. විජයරත්න (සුබසාධක ප්‍රතිලාභ මණ්ඩලයේ සභාපති), කරින් ප්‍රනාන්දු (කණ්ඩායම් නායක – තිරසාර සංවර්ධනය, CEPA), ගයනි හුරුල්ලේ (ජ්‍යෙෂ්ඨ පර්යේෂණ කළමණාකරු, LIRNEasia) සහ තාරක අමරසිංහ (සංඛ්‍යානඥ, LIRNEasia) යන මහත්ම මහත්මීහු සහභාගි වූ අතර ධනනාත් ප්‍රනාන්දු මහතා (ප්‍රධාන විධායක නිලධාරී, Advocata Institute) විසින් සාකච්ඡාව මෙහෙයවන ලදී.

LIRNEasia ආයතනයේ ගයනි හුරුල්ලේ අදහස් දක්වමින් පවසා සිටියේ “මෙතරම් කෙටි කාලයක් තුළ තවත් ශ්‍රී ලාංකිකයන් මිලියන 4ක් දරිද්‍රතාවයට ඇදවැටී තිබීම කණගාටුවට කරුණකි. එක් දරුවෙකුගේ අධ්‍යාපනයට අනෙක් දරුවාට වඩා ප්‍රමුඛත්වය දීමට පවුල්වලට සිදුවී ඇත. අපට හමු වූ බොහෝ දෙමාපියන් තම දරුවන්ට සමබර ආහාර වේලක් ලබා දීමට ඔවුන්ට හැකියාවක් නොමැති බව පෙන්වා දුන්හ. සමාජ ආරක්ෂණ ජාල සඳහා ප්‍රමාණවත් ලෙස වියදම් කිරීමෙන් රට මෙම අභියෝගාත්මක සමයේදී අවදානමට ලක් වූවන් ආරක්ෂා කළ යුතුය. සමාජ ආරක්ෂණ ජාල සඳහා ප්‍රමාණවත් ප්‍රතිපාදන වෙන් කිරීම පමණක් නොව, වෙන් කරන අරමුදල් කාර්යක්ෂමව භාවිතා කිරීම ද අවශ්‍ය වේ” යන්නයි.

## සමීක්ෂණය පිළිබඳව

ජාතික වශයෙන් නියෝජිත, එනම්, ශ්‍රී ලංකාවම නියෝජනය වන පරිදි, නිවාස 10,000 කට වැඩි සාම්පලයක් ඇසුරෙන් සමීක්ෂණය පවත්වන ලදී. මෙම සමීක්ෂණය 2022 ඔක්තෝබර් සහ 2023 මාර්තු යන කාලය අතර, ග්‍රාම නිලධාරී වසම් 400ක් පුරා පවත්වන ලදී. ජාතික මට්ටමේ ඇස්තමේන්තු, 95% විශ්වාසනීයත්වයකින් යුතුව, +/-1.4% දෝෂ පරාසයක් තුළ සිදු කළ හැක. මීට අමතරව, දිස්ත්‍රික්ක 13ක් පුරා පුද්ගලයන් 400කට අධික සංඛ්‍යාවක් සමඟ, ප්‍රධාන තොරතුරු සපයන්නන් සමඟ සම්මුඛ සාකච්ඡා, කණ්ඩායම් සාකච්ඡා, තනි පුද්ගල සම්මුඛ සාකච්ඡා සහ නිරීක්ෂණ ආකාරයෙන් ගුණාත්මක පර්යේෂණ සිදු කරන ලදී. කැනඩාවේ ඔටාවා හි ජාත්‍යන්තර සංවර්ධන පර්යේෂණ මධ්‍යස්ථානයේ ප්‍රදානයක් ආධාරයෙන් මෙම කාර්යය සිදු කරන ලදී.

## LIRNEasia පිළිබඳව

LIRNEasia යනු නැගී එන ආසියා පැසිෆික් කලාපය පුරා ක්‍රියාත්මක වන ප්‍රතිපත්ති චින්තන පර්ෂදයකි. එහි මෙහෙවර වන්නේ දැනුම, තොරතුරු සහ තාක්ෂණය භාවිතා කරමින් මිනිසුන්ගේ ජීවිත වැඩිදියුණු කිරීම සඳහා පර්යේෂණ හරහා ප්‍රතිපත්ති වෙනස් කිරීම දිරිගැන්වීමයි.

වැඩි විස්තර සඳහා ගයනි හුරුල්ලේ (ජ්‍යෙෂ්ඨ පර්යේෂණ කළමණාකරු, LIRNEasia) gayani@lirneasia.net හෝ (+94) 77 333 9727 අමතන්න.


පුවත්පත් නිවේදනය 2: ආහාර සුරක්ෂිතභාවය

# ශ්‍රී ලංකාවේ ආර්ථික අර්බුදය හේතුවෙන් නිවාස 33%ක් ආහාර අනුභව කරන්නේ අඩුවෙනි

(කොළඹ, 2023 ජුනි 7)

කලාපීය චින්තන පර්ෂදයක් වන LIRNEasia විසින් මෑතකදී කරන ලද ජාතික නියෝජිත සමීක්ෂණයකින් (ශ්‍රී ලංකාවම නියෝජනය වන පරිදි කරන ලද සමීක්ෂණයකින්) පෙන්නුම් කළ, කනස්සල්ලට තුඩුදෙන කරුණක් වන්නේ, සමීක්ෂණයට ලක් වීමට පෙර දින 7 තුළ ශ්‍රී ලංකාවේ නිවාස වලින් 33% ක් ආර්ථික අර්බුදය හේතුවෙන් සිය ආහාර පරිභෝජනය අඩු කර ඇති බවයි.

**ආහාර සම්බන්ධ හැඩගැසීමේ ක්‍රමෝපායන් - සමීක්ෂණයට දින 7කට පෙර (නිවාස වලින්%)**




**ආහාර සම්බන්ධ හැඩගැසීමේ ක්‍රමෝපායන් - සමීක්ෂණයට දින 7කට පෙර (නිවාස වලින්%)**
මූලාශ්‍රය: LIRNEasia (2023)

නිවාස වලින් 27%ක වැඩිහිටියන් තම දරුවන්ට ආහාර ලබා දීම සඳහා තමන්ගේ ආහාර පරිභෝජනය සීමා කළහ. තම සැමියා සාමාන්‍ය කම්කරුවෙකු වන, නුවරඑළියේ පදිංචි 37 හැවිරිදි මවක් වන දර්ශනී (නම වෙනස් කර ඇත) මෙසේ පැවසුවාය: "දවස් දෙකකට කලින් හොඳට අව්ව පායපු දවසක් වුනත් මගේ සැමියාට හරි හමන් වැඩක් සොයා ගැනීමට නොහැකි වුණා. ඔහු වැඩ සොයමින් නගරය පුරා ඇවිද්දත් සවස් වන විට ආපසු නිවසට පැමිණියේ ඉතා සුළු මුදලක් සමගයි. ඒ මුදලින් අපි දරුවන්ට කෑම ටිකක් හදලා දුන්නා. මම බඩගින්නේ හිටියා. මං එහෙම දවස් ගාණක් බඩගින්නේ ඉඳලා තියෙනවා. මගේ පවුලේ අයට මම කන්නේ නැහැ කියලා පෙන්වන්නේ නැහැ."

තවද, නිවාස වලින් 32% ක් එදිනෙදා අවශ්‍යතා සඳහා තම ගෘහ වත්කම් විකුණා හෝ උකස් කර ඇති අතර, 50% ක් තම ඉතුරුම් ඒ සඳහා යොදා ගත්හ. මහනුවර ප්‍රදේශයේ පදිංචි 36 හැවිරිදි මවක් වන රංජිනී (නම වෙනස් කර ඇත) තම පවුල පෝෂණය කිරීමට ප්‍රමාණවත් මුදල් නොමැති වීම නිසා තම ස්වර්ණාභරණ උකස් කළ බව සමීක්ෂණ නිළධාරීන්ට පැවසුවාය.

2023 ජුනි මස 7 වැනි බදාදා දින LIRNEasia විසින් සංවිධානය කරන ලද වැඩසටහනකදී මෙම සොයාගැනීම් බෙදා ගන්නා ලදී. එහිදී මුදල් රාජ්‍ය අමාත්‍ය ගරු ෂෙහාන් සේමසිංහ මහතා විසින් ප්‍රධාන දේශනය පවත්වන ලදී. මෙහිදී පවත්වන ලද විද්වත් සාකච්ඡාවට බී. විජයරත්න (සුබසාධක ප්‍රතිලාභ මණ්ඩලයේ සභාපති), කරින් ප්‍රනාන්දු (කණ්ඩායම් නායක – තිරසාර සංවර්ධනය, CEPA), ගයනි හුරුල්ලේ (ජ්‍යෙෂ්ඨ පර්යේෂණ කළමණාකරු, LIRNEasia) සහ තාරක අමරසිංහ (සංඛ්‍යානඥ, LIRNEasia) යන මහත්ම මහත්මීහු සහභාගි වූ අතර ධනනාත් ප්‍රනාන්දු මහතා (ප්‍රධාන විධායක නිලධාරී, Advocata Institute) විසින් සාකච්ඡාව මෙහෙයවන ලදී.

LIRNEasia හි තාරක අමරසිංහ අදහස් දක්වමින් "ආර්ථික අර්බුදය කෙතරම් දරුණු වී ඇත්ද යත් ශ්‍රී ලාංකිකයෝ මිලියන 7ක් දරිද්‍රතාවෙන් පීඩා විඳිමින් ජීවත් වෙති. මේසය මතට ආහාර වේලක් ලබාගැනීම සඳහා මුහුණ දීමට සිදුවී තිබෙන කරදර

ප්‍රමාණය අපගේ පර්යේෂණ මගින් පෙන්වා දී තිබේ. සත්ව ප්‍රෝටීන් සම්පූර්ණයෙන්මත්, බොහෝ දිනවල එළවළුත් ආහාරයට ගැනීම අත්හැර දැමූ පුද්ගලයන් අපට හමු විය. ඔවුන් ජීවත් වන්නේ බත් සහ පරිප්පු සහිත ආහාර වේලෙනි. අපගේ සමාජ ආරක්ෂණ ජාල සමාජයේ වඩාත්ම අවදානමට ලක්විය හැකි අය වෙත ළඟා වන බව තහවුරු වන පරිදි දිගටම ප්‍රතිසංස්කරණය කළ යුතුය."

## සමීක්ෂණය පිළිබඳව

ජාතික වශයෙන් නියෝජිත, එනම්, ශ්‍රී ලංකාවම නියෝජනය වන පරිදි, නිවාස 10,000 කට වැඩි සාම්පලයක් ඇසුරෙන් සමීක්ෂණය පවත්වන ලදී. මෙම සමීක්ෂණය 2022 ඔක්තෝබර් සහ 2023 මාර්තු යන කාලය අතර, ග්‍රාම නිලධාරී වසම් 400ක් පුරා පවත්වන ලදී. ජාතික මට්ටමේ ඇස්තමේන්තු, 95% විශ්වාසනීයත්වයකින් යුතුව, +/-1.4% දෝෂ පරාසයක් තුළ සිදු කළ හැක. මීට අමතරව, දිස්ත්‍රික්ක 13ක් පුරා පුද්ගලයන් 400කට අධික සංඛ්‍යාවක් සමඟ, ප්‍රධාන තොරතුරු සපයන්නන් සමඟ සම්මුඛ සාකච්ඡා, කණ්ඩායම් සාකච්ඡා, තනි පුද්ගල සම්මුඛ සාකච්ඡා සහ නිරීක්ෂණ ආකාරයෙන් ගුණාත්මක පර්යේෂණ සිදු කරන ලදී. කැනඩාවේ ඔටාවා හි ජාත්‍යන්තර සංවර්ධන පර්යේෂණ මධ්‍යස්ථානයේ ප්‍රදානයක් ආධාරයෙන් මෙම කාර්යය සිදු කරන ලදී.

## LIRNEasia පිළිබඳව

LIRNEasia යනු නැගී එන ආසියා පැසිෆික් කලාපය පුරා ක්‍රියාත්මක වන ප්‍රතිපත්ති චින්තන පර්ෂදයකි. එහි මෙහෙවර වන්නේ දැනුම, තොරතුරු සහ තාක්ෂණය භාවිතා කරමින් මිනිසුන්ගේ ජීවිත වැඩිදියුණු කිරීම සඳහා පර්යේෂණ හරහා ප්‍රතිපත්ති වෙනස් කිරීම දිරිගැන්වීමයි.

වැඩි විස්තර සඳහා ගයනි හුරුල්ලේ (ජ්‍යෙෂ්ඨ පර්යේෂණ කළමණාකරු, LIRNEasia) gayani@lirneasia.net හෝ (+94) 77 333 9727 අමතන්න.


පුවත්පත් නිවේදනය 3: අස්වැසුම ලියාපදිංචිය

# අස්වැසුම; සමෘද්ධියෙන් පියවරක් ඉදිරියට. එහෙත්, ප්‍රතිලාභීන් විය යුතු අය වෙත සන්නිවේදනය වැඩිදියුණු කළ හැකිය

(කොළඹ, 2023 ජුනි 7)

කලාපීය චින්තන පර්ෂදයක් වන LIRNEasia විසින් මෑතකදී කරන ලද ජාතික නියෝජිත සමීක්ෂණයකින් (ශ්‍රී ලංකාවම නියෝජනය වන පරිදි කරන ලද සමීක්ෂණයකින්) පෙන්නුම් කළ පරිදි, ශ්‍රී ලාංකිකයෝ මිලියන 7ක් දරිද්‍රතාවෙන් පීඩා විඳිමින් ජීවත් වෙති. මෙම පිරිස පවුල් මිලියන 2 කට සහ ගෘහ ඒකක මිලියන 1.6 කට අයත් වෙති. පවතින සමාජ ආධාර වැඩසටහන් සමාජයේ දුප්පත්ම ජනතාව වෙත ළඟා වීමට අපොහොසත් වී තිබේ. දුප්පත් කමින් වැඩිම නිවාස දහයෙන් පංගුවෙන් 31%ක් පමණක් සමෘද්ධිය ලබන අතර ධනවත් කමින් වැඩිම නිවාස දහයෙන් පංගුවෙන් 4%ක් ද සමෘද්ධිය ලබති.

වියදම් වැඩිම/ අඩුම දහයෙන් පංගු (expenditure decile) අනුව, සමෘද්ධි ප්‍රතිලාභී පවුල්
(දහයෙන් පංගු අනුව පවුල් ප්‍රතිශතය)




සුබසාධක ප්‍රතිලාභ මණ්ඩලය වඩාත් අවදානමට ලක්වූවන්ට උපකාර කිරීම සඳහා ‘අස්වැසුම’නමින් නව වැඩසටහනක් දියත් කර ඇත. ප්‍රතිලාභ අපේක්ෂකයන් පසුගිය වසරේ ප්‍රතිලාභ සඳහා ලියාපදිංචි වීමට අවශ්‍ය වූ අතර අයදුම්පත් මිලියන 3.7 ක් ලැබුණු බව රජය විසින් වාර්තා කරන ලදී. ‘අස්වැසුම’ පිළිබඳ දැනුවත් කිරීමට රජය උත්සාහ කළද, LIRNEasia සමීක්ෂණයෙන් පෙනී යන්නේ ප්‍රතිලාභ අවශ්‍ය සියලු දෙනා වැඩසටහන සඳහා ලියාපදිංචි වී නොමැති බවයි.

පළමුව, බහුවිධ සන්නිවේදන ක්‍රමෝපාය යොදාගෙන තිබියදීත්, බොහෝ පුද්ගලයෝ එවැනි වැඩසටහන් පිළිබඳව තොරතුරු වලින් යාවත්කාලීන විම සඳහා සහ අවශ්‍ය අයදුම්පත් ඔවුන්ට ලබා දීම සම්බන්ධයෙන් රජයේ නිලධාරීන් මත විශ්වාසය තබති. සමහර අවස්ථාවලදී, රජයේ නිලධාරීන් විසින් අනාගත ප්‍රතිලාභ අපේක්ෂකයන් වෙනුවෙන් අයදුම්පත් පුරවනු ලැබේ. රජයේ නිලධාරීන් සමඟ යහපත් සබඳතාවක් ඇති අය අස්වැසුම සඳහා ලියාපදිංචි වී ඇති අතර ප්‍රමාණවත් සමාජ ප්‍රාග්ධනයක් නොමැති අය වැඩසටහන ගැන හෝ එයට අයදුම් කරන ආකාරය ගැන හෝ නොදැන සිටියහ.

දෙවනුව, සුදුසුකම් නිර්ණායක පිළිබඳ වැරදි තොරතුරු හේතුවෙන් ඇතැමෙකු වැඩසටහන සඳහා ලියාපදිංචි වීම වැළකී තිබේ. අවිස්සාවේල්ල ප්‍රදේශයේ පදිංචි වතු කම්කරුවෙකු වන ශාන්ති (නම වෙනස් කර ඇත) සඳහන් කළේ “පෝර්ම වගයක් බෙදාහරින බවත්, ඒවා සම්පූර්ණ කර 2022 ඔක්තෝබර් 31 වන දින වන විට ග්‍රාම සේවක වෙත භාර දිය යුතු බවත් මට ආරංචි වුණා. නමුත් වත්තේ රැකියාවල නියුතු අය ඒ සඳහා සුදුසුකම් ලබන්නේ නැති බවත් ආරංචි වුණා.  ඒ නිසා මම ලියාපදිංචි වුණේ නැහැ.”

තෙවනුව, මීට පෙර ප්‍රතිලාභ සඳහා ලියාපදිංචි වීමට (වසර ගණනාවක් පුරා) දැරූ උත්සාහයන් අසාර්ථක වූ සමහර පුද්ගලයින්ද, ඔවුන්ගේ උත්සාහය නැවත වරක් නිෂ්ඵල වනු ඇතැයි යන අදහසින් ප්‍රතිලාභ සඳහා අයදුම් කිරීමට කැමැත්තක් නොදැක්වූහ.

2023 ජුනි මස 7 වැනි බදාදා දින LIRNEasia විසින් සංවිධානය කරන ලද වැඩසටහනකදී මෙම සොයාගැනීම් බෙදා ගන්නා ලදී. එහිදී මුදල් රාජ්‍ය අමාත්‍ය ගරු ෂෙහාන් සේමසිංහ මහතා විසින් ප්‍රධාන දේශනය පවත්වන ලදී. මෙහිදී පවත්වන ලද විද්වත් සාකච්ඡාවට බී. විජයරත්න (සුබසාධක ප්‍රතිලාභ මණ්ඩලයේ සභාපති), කරින් ප්‍රනාන්දු (කණ්ඩායම් නායක – තිරසාර සංවර්ධනය, CEPA), ගයනි හුරුල්ලේ (ජ්‍යෙෂ්ඨ පර්යේෂණ කළමණාකරු, LIRNEasia) සහ තාරක අමරසිංහ (සංඛ්‍යානඥ, LIRNEasia) යන මහත්ම මහත්මීහු සහභාගි වූ අතර ධනනාත් ප්‍රනාන්දු මහතා (ප්‍රධාන විධායක නිලධාරී, Advocata Institute) විසින් සාකච්ඡාව මෙහෙයවන ලදී.

LIRNEasia ආයතනයේ ඉසුරු සමරතුංග අදහස් දක්වමින් “අස්වැසුම වැඩසටහන යනු අපගේ සමාජ ආරක්ෂණ ජාල ප්‍රතිසංස්කරණය කිරීම සම්බන්ධයෙන් නිවැරදි දිශාවට තබන ලද පියවරකි. පද්ධතිය තුළ ගොඩනගා ඇති සංවරණ සහ තුලන මගින් සහාය අවශ්‍ය අයට ප්‍රමුඛත්වය ලබාදීමට රජයට අවස්ථාව ලැබේ. රාජ්‍ය මූල්‍ය සම්පත් සීමිත විටදී මෙය අත්‍යවශ්‍ය වේ. කෙසේ වෙතත්, වඩාත් අවදානමට ලක්විය හැකි ප්‍රජාවන් අතර සිටින සමහර පුද්ගලයින් වැඩසටහන සඳහා ලියාපදිංචි වී නොමැති බව අපට අවබෝධ වී තිබේ. රජය අස්වැසුම වැඩසටහන සඳහා ලියාපදිංචි වීම සඳහා අවස්ථාව නැවත විවෘත කළ යුතු අතර, නිලධාරීන්ට ඔවුන්ගේ දැනට පවත්නා සමාජ සබඳතා කවවලින් ඔබ්බට ගොස්, සමූහයා දැනුවත් කිරීම සඳහා දිරිගැන්වීමට විශේෂ උත්සාහයක් දැරිය යුතුය. එමෙන්ම, වැඩසටහන පිළිබඳ වැරදි තොරතුරු මැඩපවත්වමින් පද්ධතිය කෙරෙහි විශ්වාසය නැවත ගොඩනඟා ගත යුතුය.”

## සමීක්ෂණය පිළිබඳව

ජාතික වශයෙන් නියෝජිත, එනම්, ශ්‍රී ලංකාවම නියෝජනය වන පරිදි, නිවාස 10,000 කට වැඩි සාම්පලයක් ඇසුරෙන් සමීක්ෂණය පවත්වන ලදී. මෙම සමීක්ෂණය 2022 ඔක්තෝබර් සහ 2023 මාර්තු යන කාලය අතර, ග්‍රාම නිලධාරී වසම් 400ක් පුරා පවත්වන ලදී. ජාතික මට්ටමේ ඇස්තමේන්තු, 95% විශ්වාසනීයත්වයකින් යුතුව, +/-1.4% දෝෂ පරාසයක් තුළ සිදු කළ හැක. මීට අමතරව, දිස්ත්‍රික්ක 13ක් පුරා පුද්ගලයන් 400කට අධික සංඛ්‍යාවක් සමඟ, ප්‍රධාන තොරතුරු සපයන්නන් සමඟ සම්මුඛ සාකච්ඡා, කණ්ඩායම් සාකච්ඡා, තනි පුද්ගල සම්මුඛ සාකච්ඡා සහ නිරීක්ෂණ ආකාරයෙන් ගුණාත්මක පර්යේෂණ සිදු කරන ලදී. කැනඩාවේ ඔටාවා හි ජාත්‍යන්තර සංවර්ධන පර්යේෂණ මධ්‍යස්ථානයේ ප්‍රදානයක් ආධාරයෙන් මෙම කාර්යය සිදු කරන ලදී.

## LIRNEasia පිළිබඳව

LIRNEasia යනු නැගී එන ආසියා පැසිෆික් කලාපය පුරා ක්‍රියාත්මක වන ප්‍රතිපත්ති චින්තන පර්ෂදයකි. එහි මෙහෙවර වන්නේ දැනුම, තොරතුරු සහ තාක්ෂණය භාවිතා කරමින් මිනිසුන්ගේ ජීවිත වැඩිදියුණු කිරීම සඳහා පර්යේෂණ හරහා ප්‍රතිපත්ති වෙනස් කිරීම දිරිගැන්වීමයි.


වැඩි විස්තර සඳහා ගයනි හුරුල්ලේ (ජ්‍යෙෂ්ඨ පර්යේෂණ කළමණාකරු, LIRNEasia) gayani@lirneasia.net හෝ (+94) 77 333 9727 අමතන්න.

පුවත්පත් නිවේදනය 4: සමෘද්ධි සහනාධාර ලබාදීමේ පිරිවැය

# සුබසාධන ප්‍රතිලාභ නියාමනය කළ බැංකු හරහා බෙදා හැරිය යුතුය – LIRNEasia

(කොළඹ, 2023 ජුනි 7)

කලාපීය චින්තන පර්ෂදයක් වන LIRNEasia විසින් මෑතකදී කරන ලද ජාතික නියෝජිත සමීක්ෂණයකින් (ශ්‍රී ලංකාවම නියෝජනය වන පරිදි කරන ලද සමීක්ෂණයකින්) අවධාරණය කළ පරිදි, සමෘද්ධි ප්‍රතිලාභීහු තම මාසික ප්‍රතිලාභ ලබා ගැනීමට සෑම මසකම සාමාන්‍යයෙන් පැය 4ක කාලයක් වැය කරති. සමහරු සෑම මසකම පැය 12 ක කාලයක් ඒ වෙනුවෙන් වෙන් කර තිබේ.




මෙම බෙදා හැරීමේ ක්‍රියාවලිය විවිධ අභියෝග හේතුවෙන් අකාර්යක්ෂම වී ඇත. මාසික මුදල් දීමනාව සාමාන්‍යයෙන් බෙදා හරිනු ලබන්නේ අවිධිමත් ලෙස නියම කරනු ලබන සීමිත දින ගණනක් තුළය. එහි ප්‍රතිඵලයක් ලෙස 'මුදල් ගෙවන දිනවල' සමෘද්ධි බැංකුවේ අධික තදබදයක් ඇති වේ. සමහර අවස්ථා වල, නිලධාරීන් කාර්යාලයේ සිටින බවට ප්‍රතිලාභීන්ට සන්නිවේදනය කළ ද නිලධාරීන්ගේ පැමිණීම සහතික නැත. කොළඹ ප්‍රදේශයේ පදිංචි 42 හැවිරිදි මවක් වන රමණී (නම වෙනස් කර ඇත) මෙසේ පැවසුවාය: "මගේ නිලධාරියා සාමාන්‍යයෙන් උදේ 9.30 ත් 10.30 ත් අතර මුදල් ලබා ගැනීමට සමෘද්ධි බැංකුවට එන්න කියනවා. එහෙත්, සමෘද්ධි නිලධාරියා පැමිණෙන්නේ එක එක වෙලාවටයි. අපි අපේ දරුවන් පාසලෙන් රැගෙන යාමට හැකි වන පරිදි අපේ වැඩ දහවල් 1.30 වන විට අවසන් කරගැනීමට උත්සාහ කරනවා. එහෙත්, බොහෝ විට, ඊට වඩා කාලයක් ගත වෙනවා. සමහර දිනවල සමෘද්ධි බැංකුවේ නිලධාරියා නැති නිසා අපි හිස් අතින් ගෙදර එනවා."

සමහර ප්‍රතිලාභීන් තමන්ට ප්‍රතිලාභ ලබා දීමට පෙර කවුන්ටරයෙන් කවුන්ටරයට යාමට සිදුවන බව පැවසූහ. "එක් පුද්ගලයෙක් ණයක් ගෙන ඇත්දැයි පරීක්ෂා කරනවා. ගත් ණය ආපසු ගෙවා ඇත්දැයි තවත් පුද්ගලයෙක් පරීක්ෂා කරනවා. තව කෙනෙක් ගෙවීමට තිබෙන හිඟ ගෙවීම් තියෙනවද කියලා බලනවා. ඔය වගේ ලෙජර් ගොඩක් තියෙනවා" යි තිලංක (නම වෙනස් කර ඇත) පැවසීය.


බැංකු හරහා මෙම ප්‍රතිලාභ ගෙවීමට කටයුතු කරන බව 2023 අයවැය කතාවේදී රජය පෙන්වා දුන්නේය. දරිද්‍රතාවෙන් පීඩාවට පත්ව ජීවත් වන වැඩිහිටියන්ගෙන් 60% කට රජයේ හෝ පෞද්ගලික බැංකුවක එවැනි බැංකු ගිණුම් හිමි බව LIRNEasia සමීක්ෂණය මගින් හෙළිදරව් විය.

සමෘද්ධි බැංකුව යයි හැඳින්වුණ ද මහ බැංකුව විසින් නියාමනය නොකරන බැවින් සමෘද්ධි බැංකු තවමත් බැංකුවක් ලෙස සුදුසුකම් ලබා නොමැත. කෙසේ වෙතත්, සමෘද්ධි බැංකු නියාමනය කිරීමට උත්සාහ කරන බවත්, එසේ සමෘද්ධි බැංකු මහ බැංකුවේ නියාමනය යටතට ගැනීමෙන් පසු, සමෘද්ධි බැංකු හරහා මෙන්ම සෙසු බැංකු හරහා ද ප්‍රතිලාභීන්ට ඔවුන්ගේ

LIRNEasia
Pro-poor. Pro-market.

ප්‍රතිලාභ ලබා ගැනීමට අවස්ථාව ලබා දෙන බවත්, 2023 මැයි මාසයේදී රජය විසින් ප්‍රකාශ කරන ලදී. සමෘද්ධි බැංකු නියාමනය කර විධිමත් බැංකු පද්ධතියට ඇතුළත් කළහොත් බැංකු ගිණුම් හිමිකම 71% දක්වා ඉහළ යනු ඇති බව LIRNEasia හි සමීක්ෂණය මගින් පෙන්නුම් කෙරේ. ප්‍රතිලාභ ලබා ගැනීම සඳහා නව බැංකු ගිණුමක් විවෘත කිරීමට අවශ්‍ය වන්නේ සුළු පිරිසකටය.

දරිද්‍රතාවෙන් පීඩාවට පත්ව ජීවත් වන වැඩිහිටි ජනගහනය අතර බැංකු ගිනුම් හිමිකාරිත්වය
(දරිද්‍රතාවෙන් පීඩාවට පත්ව ජීවත් වන වැඩිහිටි ජනගහනයේ ප්‍රතිශතයක් ලෙස)




LIRNEasia ආයතනයෙහි ගයනි හුරුල්ලේ අදහස් දක්වමින් "සමහර ප්‍රතිලාභීන්ගේ නිවෙස්වලට අනෙකුත් බැංකු සමීපව පිහිටා තිබීමට පුළුවන. සමෘද්ධි බැංකු තම නිවෙස්වලට සමීප බව සමහරුන්ට පෙනී යා හැකිය. ප්‍රතිලාභීන්ට තම සමෘද්ධි ප්‍රතිලාභ තමන්ට පහසු බැංකුවකින් ලබාගැනීමේ හැකියාව ලබාදීමෙන්, දීමනා ලබාගන්නා ස්ථානයට ගමන් කිරීමට ගතවන කාලය අඩු කළ හැකි අතර ගෙවීම් කරන ස්ථානවල තදබදය අඩු කළ හැකිය. ඔවුන්ට ATM යන්ත්‍රවලින් මුදල් ලබා ගැනීමට හැකි නම්, ප්‍රතිලාභ ලබාගැනීම සඳහා ගතවන කාලය ද තවත් අඩු කරගත හැකි වනු ඇත. කෙසේ වෙතත්, සමෘද්ධි බැංකු ක්‍රමය පවතින බැංකුවලට වඩා ප්‍රායෝගික විකල්පයක් ලෙස ඉදිරිපත් කිරීමට පෙර, එහි තිබෙන මූලික ගැටලු විසඳා ගත යුතුය. මානව සම්පත් වඩාත් කාර්යක්ෂම කළ යුතු අතර, ප්‍රතිලාභීන්ගේ අත්දැකීම් වැඩිදියුණු කිරීම සඳහා පසුපෙළ ක්‍රියාවලින් ඩිජිටල්කරණය කළ යුතුය.

2023 ජූනි මස 7 වැනි බදාදා දින LIRNEasia විසින් සංවිධානය කරන ලද වැඩසටහනකදී මෙම සොයාගැනීම් බෙදා ගන්නා ලදී. එහිදී මුදල් රාජ්‍ය අමාත්‍ය ගරු ෂෙහාන් සේමසිංහ මහතා විසින් ප්‍රධාන දේශනය පවත්වන ලදී. මෙහිදී පවත්වන ලද විද්වත් සාකච්ඡාවට බී. විජයරත්න (සුබසාධක ප්‍රතිලාභ මණ්ඩලයේ සභාපති), කරින් ප්‍රනාන්දු (කණ්ඩායම් නායක – තිරසාර සංවර්ධනය, CEPA), ගයනි හුරුල්ලේ (ජ්‍යෙෂ්ඨ පර්යේෂණ කළමණාකරු, LIRNEasia) සහ තාරක අමරසිංහ (සංඛ්‍යානඥ, LIRNEasia) යන මහත්ම මහත්මීහු සහභාගි වූ අතර ධනනාත් ප්‍රනාන්දු මහතා (ප්‍රධාන විධායක නිලධාරී, Advocata Institute) විසින් සාකච්ඡාව මෙහෙයවන ලදී.

## සමීක්ෂණය පිළිබඳව

ජාතික වශයෙන් නියෝජිත, එනම්, ශ්‍රී ලංකාවම නියෝජනය වන පරිදි, නිවාස 10,000 කට වැඩි සාම්පලයක් ඇසුරෙන් සමීක්ෂණය පවත්වන ලදී. මෙම සමීක්ෂණය 2022 ඔක්තෝබර් සහ 2023 මාර්තු යන කාලය අතර, ග්‍රාම නිලධාරී වසම් 400ක් පුරා පවත්වන ලදී. ජාතික මට්ටමේ ඇස්තමේන්තු, 95% විශ්වාසනීයත්වයකින් යුතුව, +/-1.4% දෝෂ පරාසයක් තුළ සිදු කළ හැක. මීට අමතරව, දිස්ත්‍රික්ක 13ක් පුරා පුද්ගලයන් 400කට අධික සංඛ්‍යාවක් සමඟ, ප්‍රධාන තොරතුරු සපයන්නන් සමඟ සම්මුඛ සාකච්ඡා, කණ්ඩායම් සාකච්ඡා, තනි පුද්ගල සම්මුඛ සාකච්ඡා සහ නිරීක්ෂණ ආකාරයෙන් ගුණාත්මක පර්යේෂණ සිදු කරන ලදී. කැනඩාවේ ඔටාවා හි ජාත්‍යන්තර සංවර්ධන පර්යේෂණ මධ්‍යස්ථානයේ ප්‍රදානයක් ආධාරයෙන් මෙම කාර්යය සිදු කරන ලදී.

## LIRNEasia පිළිබඳව

LIRNEasia යනු නැගී එන ආසියා පැසිෆික් කලාපය පුරා ක්‍රියාත්මක වන ප්‍රතිපත්ති චින්තන පර්ෂදයකි. එහි මෙහෙවර වන්නේ දැනුම, තොරතුරු සහ තාක්ෂණය භාවිතා කරමින් මිනිසුන්ගේ ජීවිත වැඩිදියුණු කිරීම සඳහා පර්යේෂණ හරහා ප්‍රතිපත්ති වෙනස් කිරීම දිරිගැන්වීමයි.

වැඩි විස්තර සඳහා ගයනි හුරුල්ලේ (ජ්‍යෙෂ්ඨ පර්යේෂණ කළමණාකරු, LIRNEasia) gayani@lirneasia.net හෝ (+94) 77 333 9727 අමතන්න.